මහ කොළඹ ජලය හා අපජලය කළමණාකරණය වැඩි දියුණු කිරීම සඳහා ආයෝජන වැඩ සටහනේ - 2 ව්‍යාපෘතියේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් ගිණුම් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2014 ජූනි 03 දින එළඹි අංක 3030 දරන ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාවේ 4.03 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ණය ගිවිසුම අනුව, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර කොළඹ මහා නගර සභාව හා ජාතික ජල සම්පාදනය හා ජලාපවහන මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. ව්‍යාපෘතියේ අරමුණු වන්නේ, මහ කොළඹ ප්‍රදේශයේ ජල සැපයුම් හා අප ජලය සේවා පිළිබඳ කාර්යක්ෂමතාවය හා මූල්‍ය තිරසාරත්වය වර්ධනය කිරීමයි. ණය ගිවිසුම ප්‍රකාරව ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 15,340 කට සමාන එජඩො මිලියන 118 ක් වන අතර ඉන් රු. මිලියන. 9,100 කට සමාන එජඩො මිලියන 70 ක් ආසියානු සංවර්ධන බැංකුවේ සාමාන්‍ය ප්‍රාග්ධන සම්පත්වලින් හා රු. මිලියන 2,340 කට සමාන එජඩො මිලියන 18 ක් ආසියානු සංවර්ධන බැංකුව විසින් මූල්‍යයනය කරනු ලැබේ. තවද, ඇස්තමේන්තුගත මුළු පිරිවැයෙන් රු. මිලියන 1,396.20 කට සමාන එජඩො මිලියන 9.44 ක මුදලක් කොළඹ මහා නගර සභාව මඟින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන කාර්යයන් සඳහා වෙන්කර තිබුණි. කොළඹ මහා නගර සභාව විසින් ක්‍රියාත්මක කරන ව්‍යාපෘතියේ කාර්යයන් පිළිබඳ නිරීක්ෂණයන් මෙම වාර්තාවේ ඇතුළත් වේ. ව්‍යාපෘතියේ කාර්යයන් 2014 සැප්තැම්බර් 23 දින ආරම්භ කරන ලද අතර 2019 ජූනි 30 වන විට නිම කිරීමට නියමිතය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක, සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4. විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක, සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම් ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල, ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේ ද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමග සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේ ද යන බව,

(ඈ) විශේෂ ඩොලර් ගිණුමට මුදල් ලැබීම්, ආපසු ගැනීම් හා ආරම්භක හා අවසාන ශේෂයන් ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලබන පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස දක්වා තිබුණේද යන වග හා 2016 දෙසැම්බර් 31 දිනට ශේෂයන් එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සසඳා තිබුණේද යන වග.

(ඉ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේ ද යන බව.

(ඊ) ණය යටතේ සපයන ලද අරමුදල් ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේ ද යන බව.

(උ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදාගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේ ද යන බව,

(ඌ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව

(එ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේ ද යන බව, සහ

(ඒ) ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේ ද යන බව.

**2. මූල්‍ය ප්‍රකාශන**

----------------

**2.1 මතය**

-------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2016 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලබන පොත්පත් හා වාර්තාවල විශේෂ ඩොලර් ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂයන්, ආපසු ගැනීම් හා ප්‍රතිපූර්ණය කිරීම් සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු අතර 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබූ බව,

(ඈ) ණය ගිවිසුම්වල දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූරණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පසුගිය විගණන වාර්තා මඟින් පෙන්වා දී තිබූ කරුණු නිවැරදි කිරීමට කළමනාකරණය සාධාරණ පියවර ගෙන තිබූ බව හා

(ඊ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබූ බවත්ය.

**3. මූල්‍ය හා භෞතික කාර්යය සාධනය**

**3.1 අරමුදල් උපයෝජනය**

මූල්‍යායනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ගත ප්‍රතිපාදන 2016 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමට අනුව මූල්‍යායනය සඳහා එකඟවූ මුදල | | කොළඹ මහ නගර සභාව සඳහා වෙන්කිරීම | | සමාලේචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන්කිරීම | 2016 දෙසැම්බර් 31 දිනට උපයෝජනය කළ අරමුදල් | |
|---|---|---|---|---|---|---|---|
| | එජඩො මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන |
| ආසබැ | 88 | 11,440 | 8.00 | 1,050.40 | 124.00 | 0.19 | 27.36 |
| ශ්‍රීලංර | 30 | 3,900 | 1.44 | 345.80 | 30.00 | 0.05 | 7.93 |
| එකතුව | **118** | **15,340** | **9.44** | **1,396.20** | **154.00** | **0.24** | **35.29** |

ව්‍යාපෘතියේ මෙහෙයුම් කාලපරිච්ඡේදය වන මාස 27 ක් තුළ කොළඹ නගර සභාව විසින් ව්‍යාපෘතියේ කාර්යයන් ක්‍රියාත්මක කිරීමට වෙන්කර තිබූ අරමුදල්වලින් සියයට 2.54 ක් පමණක් උපයෝජනය කර තිබුණි. එමනිසා, වෙන්කළ මුදලින් ඉතිරි ශේෂය වන සියයට 97.46 ඉතිරි කාලපරිච්ඡේදය වන මාස 30 ඇතුළත උපයෝජනය කිරීමේ හැකියාව ගැටළු සහගත විය.

**3.2 භෞතික ප්‍රගතිය**

ලද තොරතුරු අනුව, ව්‍යාපෘතියේ ප්‍රධාන කාර්යයන් සමන්විත වන්නේ (අ) අනාගතයේදී ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තුවන මහ කොළඹ ජල හා අපජල කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - 03 සඳහා විස්තරාත්මක සැලසුම් සම්පාදනය කිරීම සඳහා සහ අපජල සේවා සඳහා ආයතනික ප්‍රතිසංස්කරණය සඳහා නිර්දේශයන් සැකසීම සඳහා සැලසුම් කිරීම, අධීක්ෂණය හා ආයතනික සංවර්ධන උපදේශනය සඳහා විස්තරාත්මක සැලසුම් සකස් කිරීම (ආ) කිලෝමීටර් 115 ක් දුර අපජල නාලිකා පිරිසිදු කිරීම තුලින් තත්ත්ව පරීක්ෂාව සිදු කිරීම සහ අපජල පිළිබඳ සිසිටීවී (CCTV) සමීක්ෂණයන් සිදු කිරීම. එසේ වුවද , 2016 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ කාර්යයන් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය අපේක්ෂිත ඉලක්කයන් කරා ළඟා වී නොතිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

**අ.** උතුරු පෝෂිත ප්‍රදේශයේ ඇති අපජල පිරිපහදු යන්ත්‍රාගාර සහ කොළඹ නගරයේ සේවා නොලබන ප්‍රදේශ 8 ක අපජල නාලිකා සහ පවතින සුළු පොම්පාගාර නගාසිටුවීම හා ප්‍රතිසංස්කරණය සම්බන්ධයෙන් වූ ශක්‍යතා අධ්‍යයන වාර්තා 2016 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කළයුතු වුවද, 2017 ජුනි 30 දින වන විටත් උපදේශකයින් විසින් ඉදිරිපත් කර නොතිබුණි.

**ආ.** කොළඹ නගරයේ අපජල නාලිකාවල කිලෝමීටර 115 දුර සඳහා තත්ත්ව පරීක්ෂණයන් සිදු කිරීම සඳහා කොන්ත්‍රාත් අධීක්ෂණය හා ප්‍රසම්පාදනය සඳහා මිල කැඳවුම් ලියකියවිලි පිළියෙල කර 2016 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කළ යුතු වුවද, 2017 ජුනි 30 වන විටත් ඉදිරිපත් කර නොතිබුණි.

ඇ. කිරුලපන - නාරාහේන්පිට ප්‍රදේශයේ අපජල නාලිකා ව්‍යාප්ත කිරීම සඳහා පොම්පාගාර 02 සඳහා සුදුසු ඉඩම් කොටසක් අත්පත්කර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු අතර එහි ප්‍රතිඵලයක් ලෙස, අදාල ප්‍රදේශයේ අපජල නාලිකා පද්ධතිය වැඩිදියුණු කිරීම සඳහා වූ ඉදිකිරීම් අධීක්ෂණය කිරීමේ කොන්ත්‍රාත්තුව 2017 ජුනි 30 දින වන විටත් ප්‍රදානය කර නොතිබුණි.

ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් කරන ලද පැහැදිලි කිරීම් අනුව, ක්‍රියාත්මක කිරීමේ නියෝජිත ආයතන විසින් කාර්යයන් නැවත සකස් කිරීම සහ ව්‍යාපෘතියේ කාර්යයන් ක්‍රියාත්මක කිරීමට උපදේශකවරුන් පත් කිරීම සඳහා කාලයක් ගත වීම හේතුවෙන් ව්‍යාපෘතියේ ඉහත සඳහන් කාර්යයන් ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වී තිබුණි.